## 1.0 හැඳින්වීම

පළමු පරිච්ඡේදය තුළින් ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ කලාපීය ප්‍රවණතා නුවමාරු, ව්‍යවසායන් අභියෝගයකට ලක්වීම යන පර්යේෂණ මාතෘකාව හඳුන්වා දේ. තවද පර්යේෂණයට අදාළ ගැටලුව, උපන්‍යාසය අරමුණු හා අභිමතාර්ථ පැහැදිලි කරමින් පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණ වාර්තාවේ දළ සැලැස්ම පිළිබඳව ද සාකච්ඡා කරනු ලබයි.

## 1.1 පර්යේෂණ මාතෘකාව හැඳින්වීම

ගෝලීයකරණ සංකල්පය පුළුල් වශයෙන් සාකච්ඡාවට ලක්වූයේ 1980 දශකයේ දී පමණය. අද අප ජීවත් වන ගෝලීය සමාජය හැඩගැසීමට පදනම සකස් වන්නේ දෙවන ලෝක යුද්ධයෙන් පසුවයි. වර්තමානය වන විට එක් කලාපයකින් තොරව අනෙක් කලාපයට ජීවත් වීමට නොහැකි වී තිබේ. එක් රටකින් තොරව තවත් රටකට, එක් ජාතියකින් තොරව තවත් ජාතියකට, පැවැත්මක් නැති තත්වයට පත්ව තිබේ. මේ හේතුවෙන් අන්තර් සබඳතාවන් සීඝ්‍රයෙන් වර්ධනය වී ඇති අතර අන්තර් රඳා පැවැත්ම ද විශාල ලෙස වර්ධනය වී ඇති බව කිව හැකිය. ඒ අනුව පැවති හුදකලා ස්වයංපෝෂිත ජාතික රාජ්‍ය ක්‍රමය යටපත් වී මුළු ලෝක සමාජයම ඒකීය සමස්ත ජාලයක් ලෙස සංවිධානය වී ඇත. මෙම ඒකීය සමස්ත ජාලයෙන් වෙන්වීම රටක ආර්ථික, දේශපාලනික, තාක්ෂණික, සමාජීය හා සංස්කෘතික ආදී සෑම ක්ෂේත්‍රයක් කෙරෙහිම බලපෑම් කරනු ලබන නිසාත් එය රටක දිළිඳුභාවය හා අස්ථාවරත්වය කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන නිසාත් වර්තමානයේ සෑම රටක්ම ගෝලීය සමාජයේ සාමාජිකයන් බවට පත්වීම වැළැක්විය නොහැකි තත්වයක් බවට පත්ව තිබේ.

දේශපාලන ආර්ථික විද්‍යාවට අනුව ගෝලීයකරණය අංශ තුනක් ඔස්සේ සාකච්ඡා කළ හැකි අතර එය වෙළෙඳ ප්‍රාග්ධන ගෝලීයකරණය, මූල්‍ය ප්‍රාග්ධන ගෝලීයකරණය හා අද වන විට ගෝලීයකරණය ලෙස හඳුනා ගන්නා නිෂ්පාදන ප්‍රාග්ධන ගෝලීයකරණයයි. මේ තරම සමාජයේ සෑම පද්ධතියක්ම බහුජාතික සමාගම් විසින් අත්පත් කොටගෙන ඇති අතර මෙහි වාසිදායක තත්වය අත්විඳිනු ලබන්නේ ධනපති රටවල් විසිනි. එනම් නිෂ්පාදන ප්‍රාග්ධන ගෝලීයකරණය තුළ මධ්‍යයේ (Center) හි පිහිටන්නේ ධනපති රටවල් වන අතර පරිවාරීය රටවල් මෙම නිෂ්පාදන ප්‍රාග්ධන ගෝලීයකරණය සඳහා ග්‍රහණය කොටගෙන ඇත.

ගෝලීය සමාජය ද අද පවතින සමාජය මෙන්ම ධුරාවලීගත සමාජයකි. මෙය සෑම රාජ්‍යම, ජාතියක්ම සමාන අයිතිවාසිකම් පවතින සහජීවනයෙන් යුත් සමාජයක් නොවේ. මෙම සමාජය ඒකීය සමස්තයක් ලෙස ක්‍රියාත්මක වන අතර අන්තර් සබඳතාවයන්ගෙන් යුක්තව ක්‍රියා කරනු ලබයි. ගෝලීයකරණ ක්‍රියාවලියේ ගාමක බලවේගය ලෙස ක්‍රියාත්මක වන්නේ ජනමාධ්‍යයන්ය. ඒ අනුව පවතින සන්නිවේදන සමාගම් විශාල ව්‍යාපාර හා කර්මාන්ත ලෙස ක්‍රියාත්මක වන අතර ලෝක තොරතුරු ක්‍රියාවලිය සම්පූර්ණයෙන් කළමනාකරණය කරනු ලබන්නේ ගෝලීය මාධ්‍ය සමාගම් විසිනි. මේවායේ හිමිකාරත්වය දරනු ලබන්නේ බටහිර රටවල්ය. මේ හේතුවෙන් ගෝලීයකරණයෙහි උපරිම වාසි අත්කර ගනු පිණිස ඔවුන් මාධ්‍ය මෙහෙයවනු ලබන්නේ බටහිර මතවාදය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ අදහසිනි. තුන්වන ලෝකයේ රටවල්වල පුවත්ති ලෙස ඉදිරිපත් කරනු ලබන්නේ එම රටවල්වල පවතින දිළිඳුකම, ත්‍රස්තවාදී කලබල, ආපදාවන් හා අශුභවාදී තොරතුරුය. නමුත් බටහිර රටවල් පිළිබඳව ධනාත්මක හා සුභවාදී පණිවිඩයන් ලෝකයේ අනෙක් කලාපවලට රැගෙන යනු පිණිස ඔවුන් විසින් මෙම ගෝලීය මාධ්‍ය මෙහෙයවනු ලබයි. මෙසේ ගෝලීය මාධ්‍ය සමාගම්වල සුවිශාල ආධිපත්‍යය හේතුවෙන් ජාතික රාජ්‍යයන්හි මාධ්‍ය පද්ධති හා කලාපීය මාධ්‍ය පද්ධතීන් යටපත්වීම නොවැළැක්විය හැකිය.

ඒ අනුව ගෝලීය තොරතුරු ක්ෂේත්‍රයේ ඉහත ක්‍රියාකාරීත්වය හේතුවෙන් නිවැරදි හා පැහැදිලි ලෙස බටහිර මතවාදයෙන් බැහැරව පුවත්ති වාර්තාකරණය සඳහා ලෝකයේ භූගෝලීය විශයෙන් වෙන්කොට ඇති කලාප ආශ්‍රිතව කලාපීය පුවත්ති හුවමාරු වැඩසටහන් බිහිවිනි. මෙම කලාපීය පුවත්ති හුවමාරු ලෝකයේ එක් එක් කලාප ආශ්‍රිතව බිහිවූයේ කලාපයේ පවතින රටවල්වල තොරතුරු හුවමාරු කර ගැනීමේ අවශ්‍යතාව වශයෙනි. බටහිර මාධ්‍ය මගින් ලබාදෙන පුවත්තිවලට විකල්පයක් ලෙස කලාපීය පුවත්ති හුවමාරුව බිහි වී ඇති අතර කලාපයේ රටවල්වල සංවර්ධන තත්ත්වයන්, සංස්කෘතික අනන්‍යතාවයන්, දේශපාලනික වටිනාකම් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වමින් කලාපීය පුවත්ති හුවමාරු ක්‍රියාත්මක වේ.

ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ කලාපීය පුවත්ති හුවමාරු යන පර්යේෂණ මාතෘකාව තුළ මා සොයන්නේ ද ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ කලාපීය පුවත්ති හුවමාරු අභියෝගයට ලක්වේද යන්නයි. මෙම පර්යේෂණ මාතෘකාව මා අධ්‍යයනය කරනු ලබන්නේ ආසියානු කලාපය ආශ්‍රිතව බිහි වී ඇති ඒෂියා විෂන් (Asia Vision ) කලාපීය පුවත්ති හුවමාරුව ඇසුරිනි. මෙම පුවත්ති හුවමාරුව ආරම්භ වන්නේ 1984 දීය. මැලේසියාවේ ක්වාලාලම්පූර් හි මෙම ඒෂියා විෂන්

ප්‍රවෘත්ති හුවමාරු මධ්‍යස්ථානය පිහිටුවනු ලබන්නේ ආසියානු රටවල ප්‍රවෘත්ති හුවමාරු කර ගැනීමේ සේවාවක් වශයෙනි.

ප්‍රවෘත්ති හුවමාරුවට සම්බන්ධ වන්නේ එහි සාමාජිකත්වය දරන්නේ එක් එක් රටවල ජාතික මාධ්‍ය ආයතනයන්ය. ප්‍රවෘත්ති හුවමාරුවේ ශ්‍රී ලාංකේය සාමාජිකත්වය දරනු ලබන්නේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවයි. මේ වන විට ඒෂියා විෂන් ප්‍රවෘත්ති හුවමාරුවේ කලාපීය රටවල සාමාජික මාධ්‍ය ආයතන සංඛ්‍යාව 21 කි. සමස්තයක් ලෙස කලාපීය ප්‍රවෘත්ති හුවමාරුවලට ගෝලීය මාධ්‍යවලට සාපේක්ෂව ආර්ථික, දේශපාලනික හා තාක්ෂණික ශක්තිය ප්‍රමාණවත් නොවීම ඒෂියා විෂන් ප්‍රවෘත්ති හුවමාරුවට ද පොදුවේ බලපා ඇත. මෙම ප්‍රවෘත්ති හුවමාරුව ගෝලීය මාධ්‍ය සමඟ තරඟකිරීමේ අභියෝගයන් බිහිවී ඇත. තවුත් ප්‍රායෝගිකව කලාපීය ප්‍රවෘත්ති හුවමාරුවක් ලෙස ඒෂියා විෂන් ප්‍රවෘත්ති හුවමාරුව ක්‍රියාත්මක වීමේදී ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ එය අභියෝගයට ලක්විය හැකිය. මේ නිසා මෙම ප්‍රවෘත්ති හුවමාරුව මීට වඩා ශක්තිමත් කොටගැනීම උදෙසා ආසියානු කලාපයෙන්ම අදාළ අවකාශය සැකසීම සිදුවිය යුතුය.

ඒ අනුව මෙම පර්යේෂණ නිබන්ධනයේ දී මා හදාරනු ලබන්නේ '**ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ කලාපීය ප්‍රවෘත්ති හුවමාරු අභියෝගයට ලක්වේ**' යන්නයි. ජනමාධ්‍ය විෂය හදාරනු ලබන විද්‍යාර්ථයකු වශයෙන් මාගේ චින්තනයට හසුවන දෙයක් වනුයේ ගෝලීයකරණ ක්‍රියාවලිය කලාපීය ප්‍රවෘත්ති හුවමාරු කෙරෙහි සෘජු හා වක්‍ර වශයෙන් බලපෑම් එල්ල කරනු ලබන බවයි. මේ බව තහවුරු කිරීම උදෙසා මා යොදා ගනු ලැබුවේ ජාතික රූපවාහිනී නාලිකාවේ ඔක්තෝබර් මස විකාශය වූ සිංහල විදෙස් ප්‍රවෘත්ති විකාශය හා ඔක්තෝබර් මාසය තුළ ඒෂියා විෂන් ප්‍රවෘත්ති හුවමාරුවෙන් ජාතික රූපවාහිනී නාලිකාවට ලැබුණු ප්‍රවෘත්තිය.

විශේෂයෙන් කලාපීය ප්‍රවෘත්ති හුවමාරු අධ්‍යයනයට ලක් විය යුතු ක්ෂේත්‍රයක් නිසාත් මේ සම්බන්ධ අධ්‍යයනයක් සිදුවී නොමැති නිසාත්, උක්ත මාතෘකාවේ වැදගත්කම හා එහි අදාළ ක්ෂේත්‍රය කෙරෙහි මා තුළ වූ දැඩි රුචිකත්වයත් මෙම පර්යේෂණයට සිදු කිරීමට මා යොමු කළ කරුණු වේ. තවද මෙහි මාගේ උපකල්පනය සාක්ෂාත් කිරීම උදෙසා පහත න්‍යායන් හා එහි සාධකයන් ගෙන එමින් ක්‍රමවේදය ඔස්සේ සනාථ කිරීමටත් උත්සාහ කෙරේ.